ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk


# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2012/08/30 |

## 2012 අගෝස්තු මාසයේ දී උද්ධමනය පහළ වැටෙයි.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද.) (2006/2007=100) මගින් මනිනු ලබන උද්ධමනය, ප්‍රධාන වශයෙන්ම ආහාර කාණ්ඩයේ මිල ගණන් අඩුවීම හේතුවෙන් ලක්ෂ්‍යමය පදනම මත පූර්ව මාසයේ පැවති සියයට 9.8 හි සිට 2012 අගෝස්තු මාසයේ දී සියයට 9.5 දක්වා පහළ වැටිණි. කෙසේ වුවද, වාර්ෂික සාමාන්‍ය උද්ධමනය 2012 ජූලි මාසයේ පැවති සියයට 6.0 හි සිට අගෝස්තු මාසයේ දී සියයට 6.3 දක්වා ඉහළ නැගිණි.

මේ අතර, මූලික උද්ධමනය ලක්ෂ්‍යමය පදනම මත 2012 ජූලි මස පැවති සියයට 6.0 හි සිට 2012 අගෝස්තු මාසයේ දී සියයට 5.9 දක්වා පහළ වැටුණු අතර, වාර්ෂික සාමාන්‍ය පදනම මත මූලික උද්ධමනය ද එම නැඹුරුවම අනුගමනය කරමින් පූර්ව මාසයේ පැවති සියයට 5.5 හි සිට අගෝස්තු මාසයේ දී සියයට 5.4 දක්වා අඩු විය.




කො.පා.මි. දර්ශක අගය 2012 ජූලි මාසයේ දී පැවති 166.7 හි සිට අගෝස්තු මාසයේ දී 165.7 දක්වා නිරපේක්ෂ වශයෙන් අඩු වෙමින් පූර්ව මාසයට සාපේක්ෂව සියයට 0.6 කින් පහළ වැටිණි. ආහාර හා මධ්‍යසාර නොවන පාන වර්ග අයත් කාණ්ඩයේ මිල ගණන් පහළ වැටීම (සියයට 1.1 කින්) දර්ශකයේ මෙම මාසික පහළ යාම කෙරෙහි ප්‍රධාන වශයෙන් දායක විය. කො.පා.මි. දර්ශකයේ ආහාර කාණ්ඩයේ පහළ යාම සඳහා එළවළු, මත්ස්‍ය හා මුහුදු ආහාර, පොල්, පොල් තෙල්, අර්තාපල්, ලොකු ළූණු, රතු ළූණු, අමු මිරිස්, බිත්තර සහ කිරි පිටි ආදියේ මිල ගණන් පහළ යාම හේතු විය. කෙසේ වුවද, සහල්, සීනි, පලතුරු සහ දෙහි ආදියේ මිල ගණන්වල ඉහළ යාමක් මෙම මාසය තුළ වාර්තා විය. ආහාර නොවන කාණ්ඩයේ රෙදිපිළි හා පාවහන් (සියයට 0.2 කින්); ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා දෛනික ගෘහ නඩත්තු (සියයට 0.2 කින්); සහ විනෝදාත්මක හා සංස්කෘතික (සියයට 0.1 කින්) යන උප කාණ්ඩයන්හි මිල ගණන් ඉහළ නැගිණි. කෙසේ වුවද, 2012 ජූලි මස 14 වැනි දින සිට එල්පී ගෑස් මිල පහළ දැමීම හේතුවෙන් නිවාස, ජලය, විදුලිය, ගෑස් හා අනෙකුත් ඉන්ධන උප කාණ්ඩයේ මිල ගණන්වල සියයට 0.7 ක පහළ යාමක් වාර්තා විය. මේ අතර, සෞඛ්‍යය; ප්‍රවාහන; සන්නිවේදන; අධ්‍යාපන; සහ විවිධ භාණ්ඩ හා සේවාවන් යන උප කාණ්ඩයන්හි මිල ගණන් මෙම මාසය තුළ නොවෙනස්ව පැවතිණි.